# අධ්‍යාපන විද්‍යායතන ප්‍රාථමික ගුරු අධ්‍යාපන පාඨමාලාවෙහි විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ශ්‍රී ලංකා කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
1998/1999 වසර අධ්‍යාපන දර්ශනපති උපාධිය
සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනය
1999 ජුනි

ඩබ්ලිව්. පී. පද්මා පර්ලි ගුණවර්ධන
ශාස්ත්‍රවේදී විශේෂ උපාධි (දෙවන පෙළ)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ඨ සම්මාන)

UCLIB
493069

පර්යේෂණ උපදේශක
කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජේ.බී. පතිරණ මහතා

## සාරාංශය

පූර්ණ පෞරුෂයකින් හෙබි පුද්ගලයන් බිහි කිරීම අධ්‍යාපනයේ මූඛ්‍ය පරමාර්ථය යි. මේ සඳහා ප්‍රාථමික අවධියේ සිට ම ශිෂ්‍ය පෞරුෂය ගොඩ නැංවීමට තුඩු දෙන අධ්‍යාපනික ක්‍රියාවලියක් අවශ්‍ය කෙරේ. එය මැනවින් ක්‍රියාත්මක කිරීමේ වගකීම ප්‍රාථමික පංතිවල ඉගැන්වීමේ නියුතු ගුරුභවතුන් වෙත පැවරේ. ප්‍රාථමික ගුරුවරුන් වෙත පැවරෙන මෙම වගකීම නිසි ලෙස ඉටු කිරීමෙහි ලා මනා පෞරුෂයක් ඔවුන් තුළ වර්ධනය වී තිබීම අවශ්‍ය කෙරේ. ඒ සඳහා ක්‍රමවත් ව ක්‍රියාත්මක කෙරෙන ගුරු අධ්‍යාපනයක් මගින් නිපුණතා, දක්ෂතා හා හැකියා වර්ධනය කර ගත යුතු වේ.

1985 සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කෙරෙන අධ්‍යාපන විද්‍යායතන ප්‍රාථමික ගුරු අධ්‍යාපන පාඨමාලාව මගින් පූර්ණ ගුරු පෞරුෂයක් වර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් ඊට උචිත විෂයමාලාවක් සැලසුම් කර ක්‍රියාත්මක කෙරේ. එකී ගුරු අධ්‍යාපන විෂයමාලාවෙහි එක් වැදගත් විෂය ක්ෂේත්‍රයක් වනුයේ විෂය සමගාමී ක්‍රියාකාරකම් ය. ගුරු අධ්‍යාපන පාඨමාලාවේ දී විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන් ලබන අත්දැකීම් තුළින් ගුරු පෞරුෂය හැඩගස්වා ගැනීමක් සිදුවෙතැයි ද, එහි අතුරු ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගෙන් ඉගෙනුම ලබන සිසුන්ට හා ප්‍රජාවට යම් මෙහෙයක් ඉටුවෙතැයි ද අපේක්ෂා කෙරේ.

පුහුණු ගුරුවරයා සතු කාර්ය භාරය සපුරාලීමට සමත් කාර්යබද්ධ ප්‍රවීණතාවක් ලබා ගැනීමේ දී අධ්‍යාපන විද්‍යායතන ප්‍රාථමික ගුරු අධ්‍යාපන පාඨමාලාවෙහි විෂය සමගාමී ක්‍රියාකාරකම් කොතෙක් දුරට ඉවහල් වන්නේ දැයි සොයා බැලීම වත්මන් අධ්‍යයනයේ අපේක්ෂාව විණි.

මෙම අධ්‍යයනය තුළින් ප්‍රාථමික ගුරු අධ්‍යාපන පාඨමාලාව හදාරන්නවුන් සඳහා ක්‍රියාත්මක කෙරෙන විෂය සමගාමී වැඩ සටහන්වල පවත්නා ප්‍රබලතා හා දුබලතා හඳුනා ගැනීමක් ද සිදු කෙරිණි. තවද ගුරු පුහුණුව ලබා සේවයට අවතීර්ණ වූවන් විෂය සමගාමී ක්ෂේත්‍රය ඇසුරින් තමන් ලද අත්දැකීම් හා කුසලතා කොතෙක් දුරට ප්‍රායෝගික ව ක්‍රියාත්මක කරන්නේ ද යන්න විමසා බැලිණි.

මෙම අධ්‍යයනය සඳහා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය යොදා ගනු ලැබිණ. ප්‍රශ්නාවලී භාවිතයෙන් හා සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් අධ්‍යයනයට අදාළ දත්ත රැස්කර ගනු ලැබිණ. අධ්‍යයනය හැසිරවීමේ දී මහවැලි, හාපිටිගම හා නිල්වලා යන අධ්‍යාපන විද්‍යායතනයන්ගෙන් අදාළ ගුරු නියැදිය හා කථිකාචාර්ය නියැදිය තෝරා ගන්නා ලදී. 300 ක ගෙන් යුක්ත වූ ගුරු නියැදියට අධ්‍යාපන විද්‍යායතන පුහුණු ගුරුභවතුන් 150දෙනෙකු හා සීමාවාසී ගුරු අභ්‍යාසලාභීන්

150 දෙනෙකු ඇතුළත් විණි. විෂය සමගාමී ක්‍රියාකාරකම සම්බන්ධයෙන් ගුරු නියැදිය දරණ ආකල්ප හා අදහස් ප්‍රශ්නාවලියක් මගින් විමසා බැලිණ. නියැදියට ඇතුළත් ගුරු පිරිසෙන් අනු නියැදියක් තෝරා ගෙන (80 ක්) එකී ගුරුවරුන්ගේ සේවා කාර්යක්ෂමතාව පිළිබඳ ව අදාළ විදුහල්පතිවරුන් ලවා තක්සේරුවක් කරනු ලැබීය. ගුරු අනු නියැදිය පිළිබඳ එකී තක්සේරුව ඉහළ මට්ටමක පැවතිණ. ගුරු නියැදියෙන් හෙළි වූ තොරතුරු තව දුරටත් තහවුරු කර ගැනීම පිණිස පළපුරුදු කථිකාචාර්ය නියැදියක් ඇසුරින් ද අදහස් විමසනු ලැබීය. ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් ලබා ගත් ප්‍රතිචාර හා හෙළි වූ තොරතුරු නිගමන ඉදිරිපත් කිරීමේ දී උපයෝගී කර ගනු ලැබිණ.

ගුරු නියැදියෙහි දෙපිරිස විසින් ප්‍රශ්නාවලියට දක්වන ලද ප්‍රතිචාර පදනම් කර ගනිමින් අභ්‍යුපගම 5 ක් ඇසුරින් කරන ලද පරීක්ෂාවෙන් අනාවරණය වූයේ පුහුණු ගුරුභවතුන්ගේ ආකල්ප රටාව ම සීමාවාසී ගුරු අභ්‍යාසලාභීන් ද දරණ බව ය. දෙපිරිස අතර ප්‍රතිචාරයන්හි වෙසෙසි වෙනසක් දක්නට නො ලැබිණ. විෂය සමගාමී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අධ්‍යාපන විද්‍යායතන මගින් ලබා දෙන පුහුණුවෙහි ප්‍රමාණවත් බව ගැන සෑහීමකට පත් විය හැකි වුව ද ක්‍රියාත්මක වීමේ දී දුබලතා රැසක් ම පවතින බව අනාවරණය විය. ගුරු සිසු සහභාගිත්වය ප්‍රමාණවත් මට්ටමක නො පැවති අතර, ලබා ගත් පුහුණු අත්දැකීම් පාසල තුළ ක්‍රියාත්මක කිරීමේ දී විවිධ ගැටළුවලට මුහුණ පා සිටින බව ද අනාවරණය විය. විෂය සමගාමී කටයුතු ප්‍රතිසංවිධානය පිළිබඳ නියැදියෙන් ඉදිරිපත් වූ අදහස් නිගමන දැක්වීමේ දී අදාළ කර ගනු ලැබිණ. ගුරු අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ දී විෂය සමගාමී කටයුතු සඳහා ලබා ඇති ප්‍රවීණතාව අවධානයට පාත්‍ර විය යුතු බව ද, ප්‍රාථමික ගුරු පුහුණුව ඉලක්ක කොට විෂය සමගාමී කටයුතු සැලසුම් කිරීම හා ක්‍රමවත්ව මෙහෙයවීම සිදු විය යුතු බව ද අධ්‍යයනයෙන් තහවුරු විය.

අධ්‍යයනයෙන් මතු කරගන්නා ලද අනාවරණ හා ඒවායින් සැපයෙන ඉඟි ඔස්සේ ප්‍රාථමික ගුරු අධ්‍යාපන පාඨමාලාවේ විෂය සමගාමී ක්‍රියාකාරකම ක්ෂේත්‍රයෙහි සංවර්ධනය උදෙසා අර්ථවත් යෝජනා ඉදිරිපත් කෙරිණ.